**හම්බන්තොට මහා නගර සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාවේ විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කඩකුළි හා වෙළඳ අයිතිය බදුදීමෙ බිල්කළ ආදායමෙන් කොරෝනා වසංගතය මත කපා හරින ලද රු. 3,270,809 ක් වර්ෂයේ ආදායමින් කපා හැරීමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්ඡිත අරමුදලට හර කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් කපාහැරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ගෙවීම වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වැඩියෙන් ප්‍රතිපූර්ණය කර ගැනීම මත ගෙවිය යුතු වියදම රු. 3,724,176 ක් වුවත් රු. 3,060,297 ක් ලෙස දැක්වූයෙන් රු. 663,879 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සිරිබෝපුර ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු. 699,720 ක් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම අඩුවෙන් දැක්වුණි. | | වියදමෙ ස්වභාවය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 1994 අංක 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව සභාවට නොලැබෙන 2016 වර්ෂයට අදාළ වසර 02 ඉක්මවූ රු. 69,000 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,972,623 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,081,325 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ඒකක 6042 කින් ලැබිය යුතු රු. 4,984,06 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිගයෙන් රු.118,155 ක් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයක් විය. | 2020 වර්ෂයේ පැවති කෝවිඩ් වසංගතය හේතුවෙන් හිඟ වරිපනම් බදු අය කිරීමේ කටයුතු වලට බාධා ඇති වීම නිසා හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) **කුලී** | | |
| i. සමාලෝචිත වර්ෂය සඳහා කඩකාමර 24 කින් ලැබිය යුතු කඩ කුලී රු. 888,693 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වෙළඳ අයිතිය බදු දීම සහ සභාව සතු යන්ත්‍ර හා උපකරණ කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු පිළිවෙලින් රු. 586,860 ක් හා රු. 64,050 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් සඳහා සිහිකැඳවීමේ ලිපි නිකුතුව හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) **බලපත්‍ර ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ඒකක 168 කින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 1,402,347 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ජූලි 28 දිනැති අංක 2238/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සාදන ලද නව නියෝග හා රෙගුලාසි වල අංක 30 දරණ රෙගුලාසියේ 05 ඡේදය ප්‍රකාරව වර්ග මීටර් 35 ත් 9393 ත් අතර වූ ව්‍යාපාරික හා නේවාසික අනවසර ඉදිකිරීම් 05 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට දැන්වූ බවත්, ඉදිරියේදී මෙම ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කරමි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කල යුතුය. |